(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 51.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2019 අප්‍රේල් 02 වැනි අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

5/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 - 2015 කාලය තුළ ආරම්භ කරනු ලැබූ උදාගම් නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවල නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iii) අදාළ ව්‍යාපෘති හරහා ප්‍රතිලාභීන් ලෙස සහන ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රටේ නිවාස නොමැති ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පැහැර හැර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

117/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දඹදිව වන්දනා ගමන් සංවිධානය කිරීමට අවසර ලත් ආයතන හා පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් හා පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා දඹදිව වන්දනා ගමන්වලදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මියගිය පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පුද්ගලයන් දඹදිව රැගෙන ගිය ආයතන කවරේද;

(vi) එසේ මියගිය පුද්ගලයන්ගේ පවුල්වල සුබසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

410/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහාලුම්වල අසුරන ලද විදුලි උත්පාදක සවි කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිෂ්ප්‍රභ කොට පළමු අවස්ථාවේ ප්‍රතික්ෂේප කරනු ලැබූ ලංසු තබන්නන් දෙදෙනෙකු නැවත ඇගයීමට ලක් කරන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ඉල්ලා සිටියේද;

(ii) වඩාත්ම සුදුසු සහ ප්‍රතිචාරාත්මක අඩුම ලංසු තබන්නා වූ සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම, 2017.07.12 දිනැති සිය වාර්තාවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව දෙවන වරටත් නිර්දේශ කරනු ලැබුවේද;

(iii) අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය නිෂ්ප්‍රභ කොට අමාත්‍ය මණ්ඩල අනුමතිය හරහා 2017.07.31 දින ඉන්දියාවේ ස්ටර්ලිං සහ විල්සන් සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළේද;

(iv) සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළේද;

(v) සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම තම ටෙන්ඩරයේ, අදාළ සවිකිරීම සඳහා ශූන්‍ය පිරිවැයක් අන්තර්ගත කර තිබියදී, ස්ටර්ලිං සහ විල්සන් සමාගමේ සහ කොරියානු සමාගමක ලංසු නැවත සලකා බලන ලෙස අමාත්‍යාංශය සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ඉල්ලා සිටි හේතුව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

479/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා කාලය තුළ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන වතුයායේ තේ දලු නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිෂ්පාදන අලෙවි කිරීමෙන් වාර්ෂිකව ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2018.06.30 දින වනවිට තේ දළු අලෙවියෙන් ලැබිය යුතු සම්පූර්ණ මුදල ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අය වී තිබේද;

(iv) නොඑසේ නම්, හිඟ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

675/'19

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් වර්ෂයකට විදේශීය සංචාරකයන් මිලියන 2.5 ක් ගෙන්වා ගැනීමේ ජාතික ඉලක්කයක් තිබෙන බවත්;

(ii) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් වැඩි පිරිසක් මුහුදු වෙරළ කලාප නැරඹීමට එන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිතව හඳුනාගෙන ඇති සංචාරක වෙරළ කලාප කවරේද;

(iii) එම සංචාරක වෙරළ කලාප කඩිනමින් ස්ථාපිත කරන්නේ කෙසේද;

(iv) මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ ආකාරයට එක් වෙරළ කලාපයක් වැඩිදියුණු කිරීමට වැය වන මුදල කොපමණද;

(ii) කිසියම් වෙරළ තීරයක් සංචාරක වෙරළ කලාපයක් ලෙස නිර්දේශිත සහතිකයක් ලබා ගැනීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

6.

755/’19

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 - 2018 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරන ලද ගම්මිරිස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉන්දියාවට ගම්මිරිස් අපනයනය කිරීමේදී බලපත්‍ර නිකුත් කිරීමේ බලය පවරා ඇති නිලධාරියා කවුරුන්ද;

(iii) ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කරන්නේද;

(iv) එසේ නම්, එම ආනයනය සඳහා බලපත්‍ර ලබා දුන් නිලධාරියාගේ සහ ආනයනකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් නිෂ්පාදනය කොපමණද;

(ii) වර්ෂ 2010 සිට 2018 දක්වා කාලය තුළ ලෝක වෙළඳපොළේ උපරිම ගම්මිරිස් මිල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

757/’19

ගරු රොෂාන් රණසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2019.01.31 දක්වා කාලය තුළ සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම හරහා මනම්පිටිය වැලි තොටුපොළින් නිකුත්කර ඇති වැලි කියුබ් ප්‍රමාණය කොපමණද;

(ii) GSMB සමාගම හරහා දෛනික වැලි නිකුත් කිරීමේ ප්‍රමුඛතාවය (ටෝකන් ලබාදීම) ලබාදීම සිදුවන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) GSMB සමාගමෙන් මනම්පිටිය වැලි තොටුපොළ වෙනුවෙන් දෛනිකව සහ මාසිකව රජයට ලැබෙන ආදායම කොපමණද;

(ii) වර්ෂ 2013 සිට 2018 දක්වා කාලය තුළ GSMB සමාගම හරහා රජයට ලැබුනු සමස්ත ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මුදල් බැර වන ගිණුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

770/'19

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා අතරින් නිල කාලය අවසන් වීම හේතුවෙන් මේ වනවිට විසුරුවා හැර ඇති පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුව මේ වනවිට ගතවී ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) විසුරුවා ඇති පළාත් සභාවලට අමතරව, ඉතිරිව ඇති පළාත් සභාවල නිල කාලය අවසන් වීමට ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iv) විසුරුවා හැර ඇති පළාත් සභාවල මැතිවරණ පවත්වා එම පළාත් සභා සක්‍රිය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 1),— 2019 ජනවාරි 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවන්හි නාමයන්,

(i) මුදල් හා ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්;

(ii) ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්; සහ

(iii) කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්;

නැවත නම් කළ යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 (1) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් වශයෙන් පත් කළ යුතුය.

එකී කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර බලා වාර්තා කිරීම සඳහා විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (05) සමන්විත විය යුතු ය.

එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තුන් දෙනෙකුගෙන් (03) සංයුක්ත විය යුත්තේ ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112(1)හි විධිවිධානවල සහ 2019 ජනවාරි 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හත් දෙනෙකුගෙන් (07) සමන්විත විය යුතු ය:—

(i) ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(ii) මහවැලි සංවර්ධන හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(iii) ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු,නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(iv) සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(v) බුද්ධශාසන හා වයඹ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(vi) මුදල් පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(vii) නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(viii) විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(ix) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(x) විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xi) අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xii) කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xiii) මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xiv) වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xv) කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xvi) මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xvii) රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xviii) නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xix) ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xx) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxi) අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxii) වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxiii) විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxiv) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxv) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව; සහ

(xxvi) විශේෂ ප්‍රදේශ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (විසිදෙවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (අප්‍රේල් 01 දින ප්‍රගතිය).

*2.

සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම්/ ප්‍රමිති සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 25 දිනැති අංක 2107/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.10.19 දින ඉදිරිපත් කරන ලද 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2017.11.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.12.07 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.12.07 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වගන්තිය අනුව 2017.10.20 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.02.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා ,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වගන්තිය අනුව 2018.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2018.07.04 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2018.03.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.24 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරි පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත යටතේ 2017.07.25 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.05.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරි පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත යටතේ 2017.07.25 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.05.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.01.24 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1971 අංක 38 දරන මුදල් පනත යටතේ 2017.10.09 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2017.12.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය යටතේ 2016.09.08 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2017.05.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.05.22 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.09.19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූලි 11 දිනැති අංක 2079/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 1),— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ඔක්තෝබර් 01 දිනැති අංක 2091/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 2),— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 2104/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 1),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 ජූලි 10 දිනැති අංක 2079/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 2),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 ඔක්තෝබර් 08 දිනැති අංක 2092/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 3),— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.02.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 නොවැම්බර් 15 දිනැති අංක 2097/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 12 දිනැති අංක 2079/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 17 දිනැති අංක 2080/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 31 දිනැති අංක 2082/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 4),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 31 දිනැති අංක 2082/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 5),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 06 දිනැති අංක 2083/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 6),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 17 දිනැති අංක 2089/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 7),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 08 දිනැති අංක 2092/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 8),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 01 දිනැති අංක 2095/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 9),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 12 දිනැති අංක 2097/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 14 දිනැති අංක 2075/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 18 දිනැති අංක 2080/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 01 දිනැති අංක 2082/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*36.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 08 දිනැති අංක 2083/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*37.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 16 දිනැති අංක 2084/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*38.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 24 දිනැති අංක 2085/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*39.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 07 දිනැති අංක 2087/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*40.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 17 දිනැති අංක 2089/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*41.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 29 දිනැති අංක 2090/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*42.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 11),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 01 දිනැති අංක 2095/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*43.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 12),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 01 දිනැති අංක 2095/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*44.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 13),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 07 දිනැති අංක 2096/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*45.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 14),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 නොවැම්බර් 23 දිනැති අංක 2098/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*46.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 15),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 දෙසැම්බර් 03 දිනැති අංක 2100/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*47.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝගය (අංක 1),— 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 58අ(1) වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 සැප්තැම්බර් 10 දිනැති අංක 2088/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*48.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝගය (අංක 2),— 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 58අ(1) වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 සැප්තැම්බර් 11 දිනැති අංක 2088/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*49.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියමය (අංක 3),— 2005 අංක 6 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 සැප්තැම්බර් 18 දිනැති අංක 2089/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*50.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 03 දිනැති අංක 2091/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.01.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 12/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*51.

මුදල් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016/2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2018.07.04 දින ඉදිරිපත් කරන ලද, 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.09.19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*52.

මුදල් අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.16 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*53.

මුදල් අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.12.04 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*54.

මුදල් අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.11.07 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*55.

මුදල් අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.06.23 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2017.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*56.

මුදල් අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.11 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.03.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*57.

මුදල් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.08.08 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2017.09.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*58.

මුදල් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය අනුව, 2017.12.07 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018.02.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*59.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.03.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 ජූලි 19 දිනැති අංක 2080/42 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*60.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*61.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*62.

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි.

*63.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*64.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*65.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*66.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*67.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*68.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*69.

පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*70.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*71.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරකණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*72.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*73.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

74.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

75.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

76.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

77.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

78.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

79.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

80.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

81.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

82.

ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

83.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

84.

වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

85.

මෝහන් ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

86.

ඡායා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---